ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2018 සැප්තැම්බර් 14 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2018 අගෝස්තු


### නිෂ්පාදන අංශය වැඩි වේගයකින් වර්ධනය විය

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2018 ජූලි මස වාර්තා කළ 57.2 ක අගයට සාපේක්ෂව 2018 අගෝස්තු මාසයේ දී 58.2 ක දර්ශක අගයක් දක්වා වැඩි විය. මෙම වර්ධනය සඳහා, විශේෂයෙන්ම රෙදිපිළි හා නිමි ඇඳුම් අංශයෙහි නව ඇණවුම් වැඩිවීම හේතුවෙන් ඉහළ ගිය නිෂ්පාදනය හේතු විය. තවද, සේවා නියුක්තිය වැඩි වේගයකින් ඉහළ යන ලදී. මේ සඳහා ආහාර සහ පාන අංශයේ ඉදිරි අපේක්ෂාවන් යහපත් වීම හේතුවෙන් අලුතින් සේවකයින් බඳවා ගැනීම ප්‍රධාන වශයෙන් බලපාන ලදී. කෙසේ වුවද, ගැනුම් තොග, යම් අඩුවීමක් පෙන්නුම් කරන ලදී. මේ සඳහා ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන අංශයෙහි ගැනුම් තොග අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. එනමුත්, රෙදිපිළි හා නිමි ඇඳුම් අංශයෙහි ගැනුම් තොග වර්ධනය විය. මේ අතර, සාමාන්‍යයෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යාම තුළින් මැත කාලීනව ආර්ථිකය වර්ධනය වන බව පිළිඹිබු වේ. එනමුත්, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යම් අඩුවීමක් පෙන්නුම් කරන ලද්දේ, පසුගිය මාසයේ ප්‍රධාන ආනයන ගමනාන්තයන්හි ඇතිව තිබූ අවහිරතා යථා තත්ත්වයට පත්වීම හේතුවෙනි. එම නිසා, ආර්ථික ක්‍රියාකාරකම්හි අඩුවීමක් එමඟින් පිළිඹිබු නොවේ. සමස්තයක් ලෙස, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කල අතර, එමඟින් 2018 අගෝස්තු මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම්, 2018 ජූලි මාසයට සාපේක්ෂව වැඩි වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කෙරෙයි. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් බව පෙන්නුම් කරයි.

| | **ව\මා** | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | **2018** | 51.7 | 55.6 | 65.6 | 45.5 | 60.6 | 57.6 | 57.2 | **58.2** | - | - | - | - |

| **විචලයය** | **ජූලි** | **අගෝ.** | **+/-** | **සාරාංශය** |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.2** | **58.2** | **+** | **වැඩි වේගයකින්, ඉහළ** |
| | | **උප දර්ශක** | | |
| **නව ඇණවුම්** | 59.5 | 60.5 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **නිෂ්පාදන** | 57.5 | 60.5 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **සේවා නියුක්තිය** | 55.0 | 56.5 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **ගැනුම් තොගය** | 57.5 | 57.0 | - | අඩු වේගයකින්, ඉහළ |
| **ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය** | 55.0 | 53.0 | - | අඩු වේගයකින්, ඉහළ |

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි වර්ධනය සුළු වශයෙන් පහළ යන ලදී

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2018 ජූලි මාසයේ දී වාර්තා වූ 57.8 ක දර්ශක අගයට සාපේක්ෂව 2018 අගෝස්තු මාසයේ දී 57.0 ක දර්ශක අගයක් දක්වා පහළ යන ලදී. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ සේවා නියුක්තියෙහි සිදු වූ වර්ධනයෙහි දායකත්වයෙන් 2018 අගෝස්තු මාසයේ දී අඩු වේගයකින් වුවද සේවා අංශය අඛණ්ඩව වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ රක්ෂණ යන අංශවල නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට හැකි විය. ප්‍රතිචාර දක්වන්නන් මෙම වර්ධනයට හේතු ලෙස ඩිජිටල් බැංකුකරණ ඒකක පිහිටුවීම සහ සේවා සැපයුම් මාර්ග වැඩිදියුණු වීම සඳහන් කර තිබුණි. දේශීය සහ විදේශීය සංචාරක කර්මාන්තවල සිදු වූ වර්ධනය හේතුවෙන් ප්‍රධාන වශයෙන් නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ ගියේය. තව ද, අගෝස්තු මාසයේ දී පැවති හජ්ජ් උත්සවය, තොග සහ සිල්ලර වෙළඳාම සඳහා ධනාත්මකව බලපාන ලදී. අගෝස්තු මාසයේ දී සේවා නියුක්ති මට්ටම වර්ධනය වූ අතර එය නිම කිරීමට ඇති කාර්යයන් පහළ යෑමට ද හේතුවක් විය. සේවා සපයන්නන්ගේ ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ සුබවාදී අපේක්ෂා වර්ධනය වුවද එය පසුගිය මාස 15 තුළ වාර්තා කළ පහළම අගය වාර්තා කරන ලදී. මූල්‍ය සේවා අංශයෙහි ප්‍රතිචාර දක්වන්නන් ඔවුන්ගේ ගණුදෙනුකරුවන් ආයෝජන තීරණ ගැනීමට 2019 වසර සඳහා රාජ්‍ය අයවැය ප්‍රකාශය බලාපොරොත්තුවෙන් සිටින බව සඳහන් කර තිබුණි. ඉන්ධන මිල ඉහළ යෑම සහ රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් වැඩි වේගයකින් ඉහළ යන ලදී. අගෝස්තු මාසය තුල දී සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද ඉහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | **2018** | 56.6 | 58.4 | 58.0 | 53.2 | 56.9 | 58.7 | 57.8 | **57.0** | - | - | - | - |

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.8** | **57.0** | **-** | **අඩු වේගයකින්, ඉහළ** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 59.9 | 60.0 | + | වැඩි වේගයකින්, ඉහළ |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.7 | 63.7 | = | සමාන වේගයකින්, ඉහළ |
| සේවා නියුක්තිය | 51.1 | 55.8 | + | වැඩි වේගයකින්, ඉහළ |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 42.9 | 42.8 | - | වැඩි වේගයකින්, පහළ |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 71.3 | 62.8 | - | අඩු වේගයකින්, ඉහළ |

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.